# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/59 – 2013 ජුනි 13 වැනි බ්‍රහස්පතින්දා – 2013.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරණාතොට කෝරළේ සුළු කොට්ඨාසයේ, කිරිඔරුව (27), ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුරිඇල්ලේගම (අ.ග.පි. 381) ගමේ පිහිටි බදුල්ල දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/ඒසීකිව්/එස්ආර්එන්/2013/324 හා 2013.03.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.0234ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටසට මායිම්:

**කැබලි අක්ෂර ඒ – ඇටඹගහපතන ඉඩම – ප්‍රමාණය : හෙක්. 2.0234ක් පමණ**

උතුරට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන සාර්නියාවත්ත සහ මාර්ග (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ග (මා.සං.අ.) සහ මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන සාර්නියාවත්ත; දකුණට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන සාර්නියාවත්ත; බටහිරට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන සාර්නියාවත්ත සහ මාර්ග (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/8/2013/පීසී/94.
2013 මැයි මස 03 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලය, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 770